# VIII ගිවිසුම් පත්‍රයේ ආකෘතිය

**ශ්‍රී ලංකා කජු සංස්ථාවේ එළුවන්කුලම වතුයායේ නව අලි අහල ඉදිකිරීම.**

**ප්‍රසම්පාදන අංකය : SLCC/PRO/78/2025 – (2025-28)**
**ප්‍රසම්පාදන ක්‍රමවේදය : ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය (ප්‍ර.මා.දේ.ස. 2024 – 3.1.2)**

**01.** 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ අංක. 60/7 දරණ 1973.05.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ස්ථාපනය කරන ලද්දා වූ, රත්මලාන, තෙලවල පාර යන ලිපිනයේ පිහිටි " **ශ්‍රී ලංකා කජු සංස්ථාව** " පළමු පාර්ශවය ලෙසට ද, ........................................................................................ යන ලිපිනයේ පිහිටි ........................................................................ දෙවන පාර්ශවය ලෙසට ද, බැඳී එකී දෙපාර්ශවය විසින් වර්ෂ 2025 .................. දින කොළඹ දී ඇති කර ගන්නා ලද ගිවිසුම් පත්‍රයයි.

**02.** තෝරාගත් කොන්ත්‍රාත්කරු වන ............................................ ලිපිනයේ පිහිටි **................................................** විසින් ඉදිරිපත් කර ඇති අංක. .................. හා ............... දිනැති මිල ලංසු ලේඛනය මෙම ගිවිසුමට **" ඇමුණුම-...... "** වශයෙන් යා කර ඇත.

**03.** ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, එළුවන්කුලම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි එළුවන්කුලම වතුයායේ (දළ **බිම් සැලැස්ම - ඇමුණුම .....) මීටර් 2450 ක දුරට නව අලි අගල ඉදිකිරීම** සඳහා ඉහත අංක **01** හි සඳහන් දෙපාර්ශවය විසින් අත්සන් කළයුතු ගිවිසුමෙහි දෙපාර්ශවය විසින් එකඟවිය යුතු කරුණු හා කොන්දේසි පහත I සිට XXV දක්වා සඳහන්ව ඇත.

**I.** පළමු පාර්ශවය විසින් එළුවන්කුලම වතුයායේ බිම් සැලැස්මෙහි සලකුණු කර ඇති මීටර් 2450 ක දුරට නව අලි අගල කිරීමේ කටයුතු 2025........... වන දින සිට ආරම්භ කල යුතුය. 2025.............. දින වන විට මුළු කොන්ත්‍රාත් කාර්යයට අදාල සියලු වැඩ කොටස් ගිවිසුමේ සඳහන් පරිදි අවසන් කළයුතු වේ. **ඒ අනුව ඉහත කටයුතු සියල්ල සම්පූර්ණ කිරීම සඳහා දින හතලිස් පහක (45) කාලසීමාවක් දෙවන පාර්ශවය වෙත හිමිවී ඇත.**

**II.** දෙවන පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලංසු ලේඛනවලට අනුව, බිම් සැලැස්මෙහි සළකුණු කර ඇති නව අලි අහලේ මීටර් එකක (01) කොටසක ගිවිසුම්ගත කාර්යය සම්පූර්ණ කිරීම සඳහා ලංසු මුදල රු. .............................. වන අතර, ඒ අනුව **සම්පූර්ණ කොන්ත්‍රාත් කාර්යයට අදාල මුළු ලංසු වටිනාකම රු. ............................ කි.**

**III.** අදාල කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමෙන් පසු ඉහත සඳහන් මුළු කොන්ත්‍රාත් කාර්යයට අදාල මුළු ලංසු වටිනාකමින් සියයට පහක (05%) ට නොඅඩු මුදලක් කාර්යය සාධන සුරක්ෂණයක් ලෙස ඉදිරිපත් කළයුතු වේ. මෙම සුරක්ෂණය මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලුවිට ගෙවීම් සිදුකල යුතු, ආපසු හැරවිය නොහැකි ලෙස ඉදිරිපත් කර තිබිය යුතුය. එය අදාල ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාර්යය නිම කිරීමට අපේක්ෂිත දිනයෙන් ඔබ්බට දින 28 ක් දක්වා වලංකා විය යුතුය.

**IV.** **නියමිත දිනයේදී වැඩ කටයුතු ආරම්භ කල වහාම, දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ඒ පිළිබඳ ලිඛිතව රාජකාරි දින පහක් (05) තුලදී දැන්විය යුතුය.**

**V.** මිල ලංසු කැඳවීමේදී දක්වා ඇති පිරිවිතරයන්ට අනුව සහ දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ඉදිරිපත් කර ඇති ලිපි ලේඛනවල සඳහන් කර ඇති පරිදි (අවශ්‍යතා උපලේඛනය II) නියමිත යන්ත්‍රෝපකරණ සියල්ලම ගිවිසුම් ප්‍රකාරව වැඩ ආරම්භ කරන පළමු දිනයේදීම අදාල ක්ෂේත්‍රයේ තිබීම වඩාත් සුදුසුවේ. **"ඇමුණුම......"**

**VI.** ගිවිසුම්ගත කාර්යය අදාලව එළුවන්කුලම වතුයායේ නව අලි අහල කැපීම සම්බන්ධයෙන් පහත සඳහන් පිරිවිතරයන් අනුගමනය කලයුතු වේ.

(අ). අලි අහලේ ගැඹුර අඩි 10 ක් විය යුතුය.

(ආ). අලි අහලේ ඉහළ කොටසේ පළල අඩි 07 ක් විය යුතු අතර, පතුලේ පළල අඩි 05 ක් විය යුතුය.

(ඇ). අලි අගල කැපිමේදී ඉහත කරනු ලබන පස් වතුයායේ ඇතුල් පසින් වැටියක් ආකාරයෙන් ගොඩ ගැසිය යුතුය.

(ඈ). අලි අගල ඉදිකිරීමේදී හැකිතාක් කජු වගාවට සහ වතුයාය තුල පවතින තේක්ක වගාවට සහ දැවමය වටිනාකමක් සහිත ශාක වලට හානි නොවන පරිදි සිදුකල යුතුය.

(ඉ). අලි අහල දෙපස මීටර් 5 බැගින් පවතින ඉඩමේ කැලය මුල් ගලවා ඉවත් කළ යුතුය.

**02 වන පිටුවට . . .**

(ඊ). අලි අගලේ හරස්කඩ හැඩය පුනීලයක හැඩයට නිර්මාණය කළයුතු අතර, එහි දළ සැලැස්මක් " **ඇමුණුම .....** " වශයෙන් ඉදිරිපත් කර ඇත.

(උ). අලි අහල ඉදිකරන සංස්ථාවට අයත් භූමි ප්‍රදේශයේ ගස් හෝ ඉන් පිටස්තර භූමි ප්‍රදේශයන්හි ගස් හෝ දර කිසිම විටෙකවත් කපා අදාල භූමියෙන් පිටතට ඉවත්කර ගැනීම සපුරා තහනම් වේ.

**VII.** ගිවිසුමට අනුව සිදුකිරීමට ඇති සම්පූර්ණ මුළු වැඩ කොටස් නිම කිරීම සඳහා දෙවන පාර්ශවය විසින් එකඟතාවය පලකොට ඉදිරිපත් කරන ලද ඉලක්කගත කාර්යයන් සඳහන් කර ඇති වගුව, **ඇමුණුම ......** මඟින් ගිවිසුමට යා කර ඇත.

**VIII.** **ඇමුණුම .....** හි සඳහන් පරිදි අදාල ගිවිසුම්ගත වැඩ කටයුතු නියමිත කාල රාමුවට අනුව අවසන් කරනු ලබන බවට අධීක්ෂණය කිරීම සඳහා පළමු පාර්ශවයේ අභිමතය පරිදි අවස්ථානුකූලව පත්කරනු ලබන නිලධාරීන් දෙදෙනෙකු (02) හා දෙවන පාර්ශවය නියෝජනය කරන නිලධාරියකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල (03) කමිටුවක් පත් කරනු ලැබේ.

**IX.** දෙවන පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති **ඇමුණුම .....** සඳහන් පරිදි ඉලක්කගත කාර්යය දින 10 බැගින් වූ කාල රාමු තුලදී සම්පූර්ණ කිරීම සඳහා දෙවන පාර්ශවය අපොහොසත් වී ඇති බවට ඉහත VIII යටතේ සඳහන් කමිටුව මඟින් නිර්දේශ කර ඇත්නම්, පූර්ව දැනුම්දීමක් සිදුකර දෙවන පාර්ශවය සමඟ අත්සන් කරන ලද ගිවිසුම අවලංගු කිරීමට පළමු පාර්ශවයට බලය පවතී. **මෙය ගිවිසුම්ගත වැඩ කටයුතු ආරම්භ කරනු ලබන පළමු කාල රාමුවේ සිටම ක්‍රියාත්මක වන අනිවාර්ය කොන්දේසියක් වේ.**

**X.** **ගිවිසුම්ගත කාර්යයට සම්බන්ධ භූමිභාගයේ පිහිටි ගස් හෝ ඉන් පිටස්තර පළමු පාර්ශවයට අයිති භූමි භාගයන්හි පිහිටි ගස් දරට කපා විකිණීම, වටිනා දැව ශාක කපා විකිණීම හා පළමු පාර්ශවයට අයත් දේපලවලට හානි කිරීම සපුරා තහනම් වන අතර,** එවැනි ක්‍රියා සම්බන්ධයෙන් වාර්තා වුවහොත් දෙවන පාර්ශවය සමඟ ඇති කරගත් ගිවිසුම අහෝසි කිරීමට පළමු පාර්ශවයට බලතල පවතී.

**XI.** **ගිවිසුම්ගත කාර්යයට සම්බන්ධ භූමිභාගයේ හෝ ඉන් පිටස්තර පළමු පාර්ශවයට අයිති භූමි භාගයන්හි වන සතුන් දඩයම් කිරීම සපුරා තහනම් වන අතර,** වනජීවී සංරක්ෂණ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව දෙවන පාර්ශවය විසින් කටයුතු කළ යුතුය. යම්හෙයකින් එසේ වාර්තා වුයේ නම්, ගිවිසුම ඒකපාර්ශවිකව අවසන් කිරීමේ බලතල පළමු පාර්ශවය සතුවිය යුතුවේ.

**XII.** ගිවිසුම්ගත කාර්යය ආරම්භ කිරීමේ සිට අවසන් කිරීම දක්වා අවශ්‍ය වන මූලික පහසුකම් සපුරා ගැනීම දෙවන පාර්ශවය විසින් සිදුකළ යුතු අතර, එම පහසුකම් සපයාදීම සඳහා පළමු පාර්ශවයට කිසිදු බැදීමක් නොමැත.

**XIII.** ගිවිසුම්ගත සම්පූර්ණ මුළු කොන්ත්‍රාත් කාර්යය ආරම්භ කිරීම සඳහා මුළු ලංසු වටිනාකමින් සියයට තිහක (30%) සවලීකරණ අත්තිකාරම් මුදලක් (Mobilization Advance) දෙවන පාර්ශවයට පළමු පාර්ශවයෙන් ඉල්ලා සිටිය හැකිය. මේ සඳහා දෙවන පාර්ශවය විසින් ලිඛිත ඉල්ලීමක් පළමු පාර්ශවය වෙත ඉදිරිපත් කළයුතු අතර, එම ඉල්ලා සිටින ලද මුදලට සමාන බැංකු ඇපකරයක්, මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලුවිට ගෙවීම් සිදුකලයුතු, ආපසු හැරවිය නොහැකි ලෙස දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ඉදිරිපත් කර කලයුතුය. අවම වශයෙන් අත්තිකාරම් මුදලක් ඉල්ලා සිටින දිනයේ සිට දින අනුවක (90) කාලයක් සඳහා වලංගු බැංකු ඇපකරය වලංගු විය යුතුවේ..

**XIV.** ගිවිසුම්ගත සම්පූර්ණ මුළු කොන්ත්‍රාත් කාර්යයයෙන් සියයට විසි පහක (25%) වැඩ කොටසක් නිම කල පසු පළමු අර්ධ ගෙවීම් මුදල (1st Part Payment) ඉල්ලුම් කිරීමට දෙවන පාර්ශවයට හැකියාව පවතින අතර, එම ඉල්ලීම ලිඛිතව පළමු පාර්ශවය වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉහත VIII යටතේ දක්වා ඇති කමිටුවේ ලිඛිත නිර්දේශය මත සම්පූර්ණ කරන ලද සියයට විසි පහක (25%) වැඩ කොටස සඳහා ගෙවීමට නියමිත මුළු මුදලින් රඳවා ගැනීම් ලෙස සියයට දහයක් (10%) ද, සවලීකරණ අත්තිකාරම් මුදලින් (Mobilization Advance) සියයට තිහක් (30%) ද අඩුකර, ඉතිරි මුදල දෙවන පාර්ශවය වෙත ගෙවීමට පළමු පාර්ශවය විසින් කටයුතු කරනු ලැබේ.

**XV.** ගිවිසුම්ගත සම්පූර්ණ මුළු කොන්ත්‍රාත් කාර්යයෙන් සියයට පනහක (50%) වැඩ කොටසක් දක්වා නිම කළපසු දෙවන අර්ධ ගෙවීම් මුදල (2nd Part Payment) ඉල්ලුම් කිරීමට දෙවන පාර්ශවයට හැකියාව පවතින අතර, එම ඉල්ලීම ලිඛිතව පළමු පාර්ශවය වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉහත VIII යටතේ දක්වා ඇති කමිටුවේ ලිඛිත නිර්දේශය මත සම්පූර්ණ කරන ලද සියයට පනහක (50%) වැඩ කොටස සඳහා ගෙවීමට නියමිත මුළු මුදලින් රඳවාගැනීම සියයට දහයක් (10%) ද සවලීකරණ අත්තිකාරම් මුදලින් (Mobilization Advance) සියයට පනහක් (50%) ද අඩුකර ඉතිරි මුදල දෙවන පාර්ශවය වෙත ගෙවීමට පළමු පාර්ශවය විසින් කටයුතු කරනු ලැබේ. මෙහිදී පළමු අර්ධ ගෙවීම් මුදල ද අඩුකර අදාල ගෙවීම් සිදුකරනු ලැබේ.

**XVI.** මෙම ගිවිසුමෙහි " **සම්පූර්ණ මුළු කොන්ත්‍රාත් කාර්යය** " ලෙස අර්ථ දැක්වනුයේ, එළුවන්කුලම වතුයායේ මායිම්ව සලකුණු කර ඇති, මීටර් 2450 ක දුරට නව අලි අහල ඉදිකිරීම සඳහා ලබාදී ඇති සියලු පිරිවිතරයන්ට අනුකූල සියලු වැඩ කොටස් වේ.

**03 වන පිටුවට . . .**

**XVII. ගිවිසුම් ප්‍රකාරව සම්පූර්ණ මුළු කොන්ත්‍රාත් කාර්යය / වැඩ නිම කිරීමෙන් පසු දෙවන පාර්ශවය විසින් ඒ බැව් පළමු පාර්ශවය වෙත රාජකාරි දින පහක් (05) ඇතුලත ලිඛිතව දැනුම්දීම සිදුකළ යුතුය.**

**XVIII.** ගිවිසුම්ගත ආකාරයට මුළු වැඩ කොටස නිමකළ පසු දින තිහක (30) කාලසීමාවක් ඇතුළත, ඉහත VIII යටතේ සඳහන් කමිටුවේ ලිඛිත නිර්දේශ ලබාගෙන, අදාල තහවුරු කිරීම් සිදුකරවා ගනිමින් එතෙක් අයකරවා නොගත් සවලීකරණ අත්තිකාරම් මුදල් හා අනෙකුත් අර්ධ ගෙවීම් මුදල් ද අඩුකර, 10% ක රඳවාගැනීමේ තැන්පතුවද ඇතුළුව මුළු ලංසු අනුව ගෙවියුතු ඉතිරි වටිනාකම දෙවන පාර්ශවය වෙත ගෙවීමට පළමු පාර්ශවය විසින් කටයුතු කරනු ලැබේ.

**XIX.** යම් හෙයකින් ගිවිසුම අවලංගු වුවහොත්, දෙවන පාර්ශවය විසින් තබන ලද කාර්ය සාධන සුරක්ෂණය (එනම් මුළු ලංසු වටිනාකමින් සියයට පහක (05%) මුදල) පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත නැවත ගෙවනු නොලැබේ. තවද ඉහත XIII හි සඳහන් සවලීකරණ අත්තිකාරම් මුදල වෙනුවෙන් තැබූ බැංකු ඇපකරයේ වටිනාකම හිමිකර ගැනීමට පළමු පාර්ශවය විසින් කටයුතු කරනු ලැබේ.

**XX. යම් හෙයකින් දෙවන පාර්ශවය විසින් කුමන හේතුවක් මත ගිවිසුමේ සඳහන් කොන්දේසි කඩ කළහොත් මෙම ගිවිසුම අවසන් කිරීමට පළමු පාර්ශවයට අයිතිවාසිකම් පවතින බවට දෙවන පාර්ශවය එකඟ වේ.**

**XXI.** යම් හෙයකින් දෙවන පාර්ශවය විසින් කුමන හේතුවක් මත හෝ ගිවිසුම කඩකරන්නේ නම්, දෙවන පාර්ශවය විසින් ඉහත VIII යටතේ සඳහන් කමිටුවේ නිර්දේශ ලබාගත් කොටස්වල ගිවිසුම්ගත සම්පූර්ණ කාර්යය අවසන් කිරීමට පළමු පාර්ශවය විසින් ලබාදෙන උපරිම කාලය දින පහළොවක් (15) වන අතර, එම කාර්යය අවසන් කිරීමෙන් පසු එම කොටස් සඳහා ගෙවීම් නිදහස් කිරීමට පළමු පාර්ශවයට සලකා බැලිය හැකිය. එසේම ගිවිසුම කඩකරන අවස්ථාව වන විට ඉහත කමිටුවේ නිර්දේශ ලබානොගත් කිසිදු වැඩ කොටසක් සඳහා ගෙවීම් සිදුකරනු නොලැබේ.

**XXII. ඉහත සඳහන් ගිවිසුම අත්සන් කිරීමෙන් පසු දෙවන පාර්ශවය විසින් එකඟතාවය පළකර ඉදිරිපත් කර ඇති අදාල සම්පූර්ණ මුළු කොන්ත්‍රාත් කාර්යයට අදාල සැලැස්මට අනුව (ඇමුණුම .....) ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාර්යය නිම කර, 2025.......... වන දිනට හෝ ඊට පෙර අදාල භූමි කොටස දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ලිඛිතව භාරදිය යුතුය. අදාල දිනය වන විට ගිවිසුම්ගත කාර්යයන් අවසන් කිරීමට දෙවන පාර්ශවය අපොහොසත් වුවහොත්, එම ප්‍රමාදවන සෑම දිනයක් සඳහාම දෙවන පාර්ශවය විසින් මීටර් එකක් සඳහා ඉදිරිපත් කල ලංසු වටිනාකමින් සියයට එකක (01%) ප්‍රමාද ගාස්තුවක් පළමු පාර්ශවය වෙත ගෙවිය යුතු වේ.**

**XXIII. තවද කොන්ත්‍රාත් ගිවිසුම තුළින් මතුවන්නා වූ සියලු ආරවුල් 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව සිදුකරනු ඇත.**

**ඉහත සඳහන් කර ඇති පරිදි ශ්‍රී ලංකා කප්පු සංස්ථාවට අයත් එළුවන්කුලම වතුයායේ මීටර් 2450 ක දුරට නව අලි අගල ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව ............................... ලිපිනයේ පිහිටි ................................. වෙත මෙයින් භාරදෙමි.**

**..........................................**
**පළමු පාර්ශවය**

**නම :**
**තනතුර :**
**ලිපිනය :**
**දිනය : 2025..................**

**සාක්ෂි :**

01. අත්සන : .................................................
නම : ..................................................
තනතුර : ................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ......................

02. අත්සන : ................................................
නම : ..................................................
තනතුර : ................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ......................

**ඉහත අංක 01 හා 02 හි සහ අංක 03 හි I සිට XXIII දක්වා සඳහන් කරුණු හා කොන්දේසිවලට එකඟවී, ශ්‍රී ලංකා කප්පු සංස්ථාවට අයත් එළුවන්කුලම වතුයායේ මීටර් 2450 ක දුරට නව අලි අගල ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව සාර්ථකව නිමකර දීමට මෙයින් භාරගනිමි.**

**..........................................**
**දෙවන පාර්ශවය**

**නම :**
**ජාතික හැඳුනුම්පත් අංකය :**
**ආයතනයේ නම :**
**ආයතනයේ ලිපිනය :**
**දිනය : 2025...........**

**සාක්ෂි :**

01. අත්සන : ..................................................
නම : ..................................................
තනතුර : ................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ......................

02. අත්සන : ..................................................
නම : ..................................................
තනතුර : ................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ......................